# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2412/34 - 2024 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2024.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.21/78(XV)(සී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය, හරිනි අමරසූරිය වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ ) 1986 සැප්තැම්බර් මස 26 වන දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, (2007 නොවැම්බර් මස 14 වන දින අංක 1523/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන “වාණිජ විද්‍යා හා කළමනාකරණ පීඨය” යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන “3. කළමනාකරණ අධ්‍යයනාංශය” යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

“4. ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයන අංශය”

**හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍ය.

2024 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

EOG 11-0186



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*